ලංසු සඳහා ආරාධනාවයි

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

කිරින්ද ධීවර වරාය භූමියේ ගොඩගසා ඇති මුහුදු වැලි කියුබ් 11,100ක් නිර්දේශිත වෙරළ තීරය වෙත බැහැර කිරීම සහ තුනී කිරීම සඳහා ලංසු කැඳවීම (දෙවන අදියර)

ප්‍රසම්පාදන අංක : CFHC/PD/SAND/KIR/2026/121

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ඉහත සඳහන් ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් සැපයුම්කරුවන් හෝ නම් කළ නියෝජිතයින් සඳහා 2026.10.21 දින සිට 2026.11.09 දින දක්වා රාජකාරී දිනයන් හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය වෙතින් හෝ කිරින්ද ධීවර වරාය වෙතින් ලිඛිත ඉල්ලීමක් කිරීමෙන් ආපසු නොගෙවනු ලබන රු. 5,000.00 ක මුදලක් ගෙවීමෙන් අනතුරුව ප්‍රසම්පාදන ලේඛන ලබා ගත හැකිය.

නියමිත පරිදි අත්සන් කොට තිල රබර් මුද්‍රාව යොදා ප්‍රසම්පාදන ලේඛන ලිපි කවරයක ඇතුළත් කොට එහි වම් කෙළවරේ අදාළ කොන්ත්‍රාත්තුවේ නම සඳහන් කර 2026.11.10 දින පෙ.ව. 11.00 ට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථා ප්‍රධාන කාර්යාලයේ දෙවන මහලේ ප්‍රසම්පාදන අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ හැකිය.

විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ලේඛන 2026.11.10 දින පෙ.ව. 11.00 ට පසු වූ වහාම ප්‍රසම්පාදන අංශයේ දී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ප්‍රසම්පාදන ලේඛන ප්‍රතික්ෂේප කරන අතර විවෘත කිරීමකින් තොරව ආපසු භාර දෙනු ලැබේ.

අදාළ ප්‍රසම්පාදන ලේඛන පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් වශයෙන් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

පූර්ව ලංසු රැස්වීම 2026.10.30 වන දින පෙ.ව. 11.00 ට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථා ප්‍රධාන කාර්යාලයේ පළමු මහලේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී පැවැත්වේ.

මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු 0112-525063/0112529391හෝ www.cfhc.gov.lk / www.promise.lk වෙබ් අඩවි පරිශීලනයෙන් ලබා ගත හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක:15, රොක්හවුස් පටුමග, කොළඹ 15.